**එළවළු සංවර්ධන මණ්ඩලය**
-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-----------------------------------

2002 සිට 2010 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. **විගණන නිරීක්ෂණ**
-------------------

2.1 **ක්‍රියාකාරිත්වය**
----------------

2001 වර්ෂයෙන් පසු මණ්ඩලයේ කටයුතු අක්‍රීය වී තිබුණු අතර ඊට අදාලව කාර්ය මණ්ඩලයක් හා පාලන මණ්ඩලයක්ද නොවීය. තවද මණ්ඩලයේ කටයුතු ක්‍රියාත්මක කිරීම හෝ ඇවර කිරීම සඳහා අමාත්‍යාංශය කටයුතු කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, මණ්ඩලය පිහිටුවීමට අදාල අණපනත්ද විගණනයට ඉදිරිපත් නොවීය.

2.2 **ගිණුම්, පොත්පත් හා ලේඛන පැවැත්වීම**
-------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල ගිණුම්, පොත්පත් හා ලේඛන පැවැත්වූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.

2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම

----------------------------------

මණ්ඩලය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2001 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පත්‍රයේ දැක්වෙන පහත සඳහන් වත්කම් හා බැරකම් සම්බන්ධ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ පැවැත්ම හා නිවැරදිතාවය පිළිබඳ සතොසක්ෂණය කළ නොහැකි විය.

| වත්කම් | රු. | බැරකම් | රු. |
|---|---|---|---|
| කාර්යාල උපකරණ | 253,136 | ගෙවිය යුතු බැංකු පොලී සඳහා බදු | 72,454 |
| ස්ථාවර තැන්පතු | 5,480,400 | ගෙවිය යුතු විගණන ගාස්තු | 37,125 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී | 724,542 | උපචිත වියදම් | 5,548 |
| බැංකු ඉතිරිය | 971,878 | | |

2.4 අරමුදල් ආයෝජනය

-----------------------

රාජ්‍ය බැංකුවකට අයත් ස්ථාවර තැන්පත් ගිණුමක රු.4,200,000 ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබූ අතර එහි වාර්ෂක පොලිය ජංගම ගිණුමකට බැර වෙමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම ජංගම ගිණුමේ පැවති රු.6,854,184 ක ශේෂය ඵලදායි ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.